පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **10**

අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 1/11**

පාසලේ නම : ....

ඇතුළත්වීමේ අංකය : ....

කාලය : පැය 03යි.

සැලකිය යුතුයි.

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්ණවලට දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.

1. අර්ථවත් .... ලබා ගත හැකි වන්නේ ………….. ගොනු කිරීමෙන් සහ සකස් කිරීමෙන් වන අතර එය තීරණ ගැනීම සඳහා උපකාරීවේ.
ඉහත හිස්තැන් සඳහා පිලිවෙළින් ගැලපෙනුයේ,

(1) දත්ත, ප්‍රතිදානය
(2) ආදානය, තොරතුරු
(3) තොරතුරු, දත්ත
(4) දත්ත, තොරතුරු,

2. පරිගණකය සතු ගති ලක්ෂණයක් නොවන්නේ ,

(1) වේගවත්බව
(2) බහුශ්‍රැත බව.
(3) නිරවද්‍යතාවය.
(4) බුද්ධියක් නැති බව.

3. ශ්‍රී ලංකා රජයේ වෙබ් පිටුව(http://www.gov.lk), රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය(1919), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) යන උදාහරණයන් ශ්‍රී ලංකාවේ පහත කුමන සේවාවකට වේද?

(1) අධ්‍යාපන ක්ෂේත්‍රයේ යෙදවුම් සඳහා.
(2) සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යෙදවුම් සඳහා.
(3) ඉ-රාජ්‍ය යෙදවුම් සඳහා .
(4) කෘෂි කර්මාන්තයේ යෙදවුම් සඳහා.

4. දීර්ඝ කාලීන ලෙස කැලිකසළ බැහැර කරන ලද භූමියක් වගා බිමක් ලෙස සකස් කිරීමට අවශ්‍යව ඇත. මෙම භූමිය වගාවට ආරම්භ කිරීමට පෙර සිදුකල යුතු වඩාත් යෝග්‍ය තාත්ෂණික ක්‍රමය වනුයේ.

1. භූමියට ජල සැපයුමක් ලබා දී පස හොඳින් තෙත් කිරීම.
2. කාබනික පොහොර යොදා පස සකස් කිරීම.
3. වගා භූමිය මතුපිටින් බාහිරින් ගෙනන ලද පස් අතුරා සකස් කර වගාව ආරම්භ කිරීම.
4. වගා බිමෙහි තත්වය මනින යන්ත්‍රය මගින් පස් සාම්පල පරීක්ෂා කර වගාවට සුදුසු දැයි තහවුරු කර ගැනීම.

5. පරිගණකය වෙතින් සැකසූ තොරතුරු පිටතට ලබා ගැනීමට භාවිත වේ.

(1) ආදාන උපාංග
(2) සැකසුම් උපාංග
(3) ප්‍රතිදාන උපාංග
(4) ගබඩා උපාංග

6. මූසිකය, ස්පර්ශක තිරය, මෙහෙයුම් යටිය , ආලෝක පෑන යනාදිය .... උදාහරණයන් වේ.

(1) රූප සහ වීඩියෝ අදාන උපාංග
(2) සුපරීක්ශක උපාංග
(3) දැක්වීමේ උපාංග
(4) ශබ්ද ආදාන උපාංග

7. තේමිය තම වෙළඳ ආයතනයේ මිළදී ගැනීම් සඳහා රිසිට් පතක් නිකුත් කිරීමට යන්ත්‍රයක් මිළදී ගන්නා ලදී. ඔහු හදිසි අවශ්‍යතාවකදී ATM යන්ත්‍රයෙන් මුදල් ලබා ගත් පසු ලද රිසිට් පතද තම ආයතනයෙන් නිකුත් කරනු ලබන රිසිට් පතද එක් සමාන බව අවබෝධ විය.එම රිසිට්පත් මුද්‍රණයේදී භාවිත වූ මුද්‍රණ යන්ත්‍රය වන්නේ,

(1) තීන්ත විදුම් මුද්‍රණ යන්ත්‍රය(Ink Jet Printer)
(2) ලේසර් මුද්‍රණ යන්ත්‍රය
(3) තාප මුද්‍රකය(Terminal Printer)
(4) ලකුණුකරණය (Plotter)

8.පහත දැක්වෙන පරිගණක ජාල වින්‍යාසය (Network Topology) සඳහා ව්‍යවහර වන පදය වන්නේ,

(1) රුක් (Tree)
(2) දැල(Mesh)
(3) තරුව(Star)
(4) මුදුව (Ring)



9. BCD අගයක් විය නොහැකි බිටු මෝස්තරය (Bit Pattern) කුමක් ද?

(1) 10011000 (2) 10101001 (3) 01011000 (4) 01100011

10. $8D_{16}$ ට තුල්‍ය දශමය සංඛ්‍යාව වන්නේ,

(1) 145_{10} (2) 141_{10} (3) 254_{10} (4) 155_{10}

11. එකිනෙකට වෙනස් අනුලක්ෂණ 128 ක් නිරූපණය කළ හැකි කේත ආකාරය වන්නේ,

(1) BCD (2) EBCDIC (3) ASCII (4) UNICODE

12. පහත දැක්වෙන සංගෘහිත පරිපථය සලකා බැලීමේදී , තුඩු 12= 1 නම් තුඩු 11 සහ තුඩු 13 හී අගයයන් කුමක් විය හැකිද?

- A- 0,1 B- 1,0 C- 1,1

(1) A සහ B පමණි
(2) A පමණි
(3) B පමණි
(4) A සහ C පමණි



13. ප්‍රශ්න පත්‍රයක් a, b, c, d, e කොටස් පහකින් සමන්විත වේ.අපේක්ෂකයින් විසින් කොටස් 03 ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය.a කොටස අනිවාර්ය වන අතර b හෝ c කොටස් වලින් ඒක් ප්‍රශ්නයක්ද d හෝ e කොටස් වලින් ඒක් ප්‍රශ්නයක්ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතුය.අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුතු ආකාරය නිරූපනය වන්නේ පහත ඒවායින් කුමකින්ද?

(1) a OR (b AND c) OR (d OR e)
(2) a AND (b OR c) OR (d AND e)
(3) a AND (b AND c) (d OR e)
(4) a AND (b OR c) AND (d OR e)

14. P, Q, R ආදාන තුනක් හා F නම් ප්‍රතිදාන එකක් සහිත තර්කන පරිපථය සලකන්න. එම පරිපථයෙහි පහත නිරීක්ෂණ දක්නා ලදී.

a . ඕනෑම එක් ආදානයක් 1 වේ නම්,ඉතිරි ආදාන කුමක් වුවද F ප්‍රතිදානය 0 වේ.
b . සියළුම ආදාන 0 නම් F ප්‍රතිදානය 1 වේ.

1.


2.


3.


4


15. මෙම තාර්කික පරිපථයට තුල්‍ය වන සත්‍යතා වගුව කුමක්ද?

A	B	Z
0	0	1
0	1	1
1	0	0
1	1	1

A	B	Z
0	0	1
0	1	1
1	0	1
1	1	0

A	B	Z
0	0	1
0	1	1
1	0	1
1	1	1

A	B	Z
0	0	1
0	1	0
1	0	0
1	1	1



16. මෙහෙයුම් පද්ධතිය මගින් සපයනු ලබන ප්‍රධාන සේවාවන් දෙක වනුයේ,

(1) පරිශීලක අතුරුමුහුණත් සැපයීම / තැටි ප්‍රතිභාගිකරණය
(2) තැටි ආකෘතිකරණය / තැටි ප්‍රතිස්ථාපනය
(3) දෘඪාංග කළමනාකරණය / පරිශීලක අතුරුමුහුණත් සැපයීම
(4) තැටි පංගුකරණය / දෘඪාංග කළමනාකරණය

17. මෙහෙයුම් පද්ධති වල ක්‍රියාකාරිත්වය අනුව වර්ගීකරණය කරනු ලබන්නේ

(1) ඒක පරිශීලක/ බහු පරිශීලක / බහු කාර්යය /තත්‍ය කාල
(2) පංගු බෙදීම / ආකෘතිකරණය / ප්‍රතිභාගිකරණය / සුපරීක්ෂණය
(3) මතක කලමනාකරණය / උපාංග කළමනාකරණය / ගොනු කළමනාකරණය
(4) පද්ධති මෘදුකාංග / යෙදුම් මෘදුකාංග / උපයෝගිතා මෘදුකාංග

18. බූට් කිරීම (booting) යනු පරිගණකයේ මතකයට මෙහෙයුම් පද්ධතිය .... කිරීමයි.

1) සකස් කිරීම (Processing).
2) පූරණය (Loading)
3) පැවරීම (Assigning).
4) පිටපත් කිරීම (copying)

19. වදන් සැකසුම් මෘදුකාංගයක දී අක්ෂර වල ප්‍රමාණය විශාල කිරීම සඳහා භාවිත කරනු ලබන්නේ,

(1)
(2)
(3)
(4) 

20. වදන් සැකසුම් මෘදුකාංගයක දී Ctrl + H කෙටි මං යතුරු මගින් සිදුවනුයේ,

(1) පිටපත් කරන ලද දෙයක් ඇලවීම.
(2) මුද්‍රණ පිටපතක් ගැනීමයි.
(3) වචන සොයා ප්‍රතිස්ථාපනය කිරීමයි.
(4) උදව්වක් ගැනීමයි.

21. ‘X’ පාඨ සඳහා යොදා ඇති හැඩසව් ගැන්වීම් (Font Formatting) සියල්ල එකවර ‘Y’ පාඨ සඳහා පිටපත් කිරීම සඳහා යොදාගත හැකි මෙවලම වන්නේ,

X. ***<u>We are changing the world with Technology</u>***
Y. Technology is best when it brings people together.

(1)
(2)
(3)
(4) 

22. පහත ඒවායින් පිටු දිශානතිය (Page Orientation) සකස් කරන ආකාර වන්නේ?

(1) Bullets හා Numbering.
(2) Superscript හා Subscript
(3) Portrait හා Landscape .
(4) Find හා Replace

23. රූපයේ E2 කෝෂයේ ඇති සූත්‍රය E4 කෝෂය දක්වා පිටපත් කල විට E3 කෝෂයේ සූත්‍රය දැක්වෙන්නේ ,

(1) =A1*D4
(2) =A1$*D3
(3) =$A1*D3
(4) =A$1*D3



24. රූපයේ A,B,C ඊ හිස් අනුපිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

(1) සක්‍රීය කෝෂය(active cell),සූත්‍ර තීරුව(formula bar) ,ලිපින තීරුව(address bar)
(2) සූත්‍ර තීරුව, ලිපින තීරුව, සක්‍රීය කෝෂය
(3) ලිපින තීරුව, සූත්‍ර තීරුව, සක්‍රීය කෝෂය
(4) සූත්‍ර තීරුව, සක්‍රීය කෝෂය, ලිපින තීරුව

25. A1:D1 දක්වා එකතුව ලබා ගැනීමට F1 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය වන්නේ,

(1) =average(A1:D1)
(2) =SUM(A1:D1)
(3) sum(a1:d1)
(4) average(a1:d1)

26. ඔබේ පන්තියේ 10 වසර වාර විභාගයේ එක් එක් විෂයට අදාල ලකුණු පෙන්වීම සඳහා වඩාත් සුදුසු ප්‍රස්තාර වර්ගය වන්නේ,

(1) වට ප්‍රස්තාර
(2) රේඛා ප්‍රස්තාර
(3) තීර ප්‍රස්තාර
(4) X-Y ප්‍රස්තාර

27. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයක A1:C3 කෝෂ පරාසයේ ඇති කෝෂ ගණන වන්නේ,

(1) 3
(2) 6
(3) 9
(4) 12

28. විද්‍යුත් සමර්පණ මෘදුකාංග වල ඇති පහත දසුන් අතරෙන් කදා තෝරන දසුන (Slide Sorter View) වන්නේ,

A

B

C


D

(1) A (2) B (3) C (4) D

29. සමර්පණයක් දර්ශනය වීමේදී එක් කදාවක සිට ඊ ලග කදාවට මාරු වන විට ඇති වෙන දෘශ්‍ය චලනයන් මේ නමින් හැදින්වේ.

(1) කදා සැලසුම (Slide Design)
(2) සජීවීකරණ (Animation)
(3) කදා සංක්‍රමණ (Slide Transition)
(4) කදා පිරිසැලසුම (Slide Layout)

30. සමර්පණයක ඇති කදාවක තනි අයිතමයක් මත යෙදූ දෘශ්‍ය ආවරණ .... නම් වේ.

(1) කදා සැලසුම (Slide Design)
(2) සජීවීකරණ (Animation)
(3) කදා සංක්‍රමණ (Slide Transition)
(4) කදා පිරිසැලසුම (Slide Layout)

31. විද්‍යුත් සමර්පණයක් භාවිතයෙන් ඉටුකරගත නොහැකි කාර්යයක් වනුයේ,

(1) තැපැල් මුසුව (mail merge) භාවිත කළ හැක.
(2) වස්තූන් වලට සජීවීකරණයක් සිදුකළ හැක.
(3) වගු නිර්මාණය කළ හැක.
(4) ප්‍රස්ථාර නිර්මාණය කළ හැක.

32. නව සමර්පණයක් සකස් කිරීමට .... යන කෙටිමං යතුරු සංයෝජනය භාවිත කල හැකි අතර සමර්පණයකට නව කදාවක් ඇතුළු කිරීමට .... යන කෙටි මං යතුරු සංයෝජනය භාවිතා කල යුතු වේ. ඉහත හිස්තැන් සඳහා වඩාත් සුදුසු වන්නේ පිලිවෙළින්,

(1) Ctrl+N හා Ctrl+N
(2) Ctrl+M හා Ctrl+N
(3) Ctrl+M හා Ctrl+M
(4) Ctrl+N හා Ctrl+M

33. විදෙස් ගමන් බලපත්‍ර අංකයක් (උදා- N354373) දත්ත සමුදාය වගුවක ගබඩා කර ගැනීම සඳහා යෝග්‍යතම දත්ත ප්‍රරූපය වන්නේ මින් කුමක්ද?

(1) සංඛ්‍යා(Numbers)
(2) මුදල්(Currency)
(3) දිනය/වේලාව(Date/Time)
(4) පාඨ(Text)

34. වගුවක රෙකෝඩයක් (Record) අනන්‍ය (Unique) ව හඳුනා ගත හැකි තීරුවක් ....ලෙස හැදින්වේ.

(1) යතුරු(Key)
(2) ප්‍රධාන යතුර (main key)
(3) විකල්ප යතුරු (alternate key)
(4) ප්‍රාථමික යතුර(primary key)

35. දත්ත සමුදාය සම්බන්ධයෙන් වන පහත ප්‍රකාශ සලකන්න.
A. ආකෘති පත්‍ර භාවිත කර දත්ත ආදානය කළ හැක.
B. වගුවක් විවෘත කර දත්ත ආදානය කළ හැක.
C.වාර්තාවක් භාවිත කර දත්ත ආදානය කළ හැක.

ඉහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A සහ B පමණි.
(2) A පමණි.
(3) A සහ C පමණි.
(4) B සහ C පමණි.

36. වගුවක එක් එක් තීරුවල දත්ත නැවත නැවත ඇතුළත්වීම හඳුන්වන්නේ,
(1) දත්ත අනුපිටපත්වීම(Data Duplication)
(2) දත්ත ප්‍රරූප(Data Types)
(3) දත්ත සමතිරික්තතාව(Data Redundancy)
(4) සම්බන්ධතාව(Relationship)

37. දත්ත සමුදාය වගුවක(Database table) පේළි, රෙකෝඩ(Records) ලෙස හඳුන්වන අතර එහි තීර හඳුන්වනු ලබන්නේ,

(1) ලේබල (Labels) ලෙස ය.
(2) ක්ෂේත්‍ර (Fields) ලෙස ය.
(3) දත්ත ප්‍රරූප(Data Types) ලෙස ය.
(4) කෝෂ (Cells) ලෙස ය.

38. දත්ත පාදකයකට (Database) දත්ත ඇතුළු කිරීම සඳහා පහත දැක්වෙන ඒවායින් කුමක් භාවිත කළ හැකිද?

(1) සටහන(Chart)
(2) වාර්තාව(Report)
(3) පෝරමය(Form)
(4) සුචිය(Index)

39. දත්ත සමුදායක(Database) records අකාරාදී පිළිවෙලට සකස් කිරීම හඳුන්වන්නේ,

(1) Replacing
(2) Searching
(3) Selecting
(4) Sorting

40. ආරක්ෂක උපක්‍රමයක් ලෙස පරිගණකය භාවිතය සීමා කිරීමට වඩාත් සුදුසු වන්නේ,

(1) මුරපදයක් (password) යෙදීම
(2) ප්‍රති වයිරස මෘදුකාංගයක් යෙදීම
(3) ගිනි පවුරු (Fire wall) භාවිතය
(4) CCTV සවි කිරීම

10 ශ්‍රේණිය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II කොටස

- **පළමු ප්‍රශ්ණය හා තවත් ප්‍රශ්ණ 04ක් ද ඇතුළුව ප්‍රශ්ණ 5 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්ණයට ලකුණු 20ක් සහ අනෙකුත් සෑම ප්‍රශ්ණයක්ම සඳහා ලකුණු 10 බැගින් හිමිවේ.**

1.

i. BCD සම්මතයෙන් බිටු .... ක් යොදාගෙන දශමය සංඛ්‍යා නිරූපනය කළ හැකි අතර ඇස්කි කේත ක්‍රමයේ දී භාවිතා කරන බිටු ප්‍රමාණය .... ක් වේ. හිස්තැන් සඳහා සුදුසු වචන යොදන්න.

ii. නාභිය (hub) සහ ස්විචය (Router) අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. පරිගණක ජාල ඔස්සේ ශ්‍රව්‍ය හා දෘශ්‍ය දත්ත විවිධ අඩවි වල සිටින සහභාගී වන්න දෙදෙනෙක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සමග පවත්වාගෙන යාමේ කාර්යාවලිය දෘශ්‍ය සම්මන්ත්‍රණ (video Conferencing) වන අතර මෙමගින් ලැබෙන ප්‍රධාන වාසි 02ක් සඳහන් කරන්න.

iv. $8EC_{16}$ යන ෂඩ් දශමය සංඛ්‍යාව ද්වීමය සංඛ්‍යාවකට පෙරලන්න.(අදාළ පියවරයන් ඇතුලත් කරන්න.

v. වෙළෙන්දෙක් අයිතම තුනක පැකේජයක් රු 300/= ක මිලකට විකුණයි. එම පැකේජයේ පිගානක් (P) හා ජෝගුවක් (J) අඩංගු වේ.පාරිභෝගිකයාට තුන් වන අයිතමය ලෙස කෝප්පයක් (C) හෝ දීසියක් (D) තෝරා ගත හැකිය.මෙම සංසිද්ධිය නිරූපනය කෙරෙන බූලීය ප්‍රකාශනයත් ඊට අදාළ සත්‍යතා වගුවත් ගොඩනගන්න.

vi. ගොනු (file) සහ බහාලුම් (folders) කෙටියෙන් විස්තර කරන්න

vii. වදන් සැකසුම් මෘදුකාංගයේ ඇති change case පහසුකම අනුව පහත සඳහන් පද ලැයිස්තුව භාවිතා කර වගුව සම්පුර්ණ කරන්න

පද ලැයිස්තුව - { Sentence case / Lowercase/ UPPERCASE / Capitalize Each Word / tOGGLEcASE}

	එක් වචනයේ පළමු අකුර simple අකුරින් හා අනෙක් අකුරු capital අකුරින් තබයි.
	එක් වචනයේ පළමු අකුර capital අකුරින් හා අනෙක් අකුරු simple අකුරින් තබයි.
	වාක්‍යයේ මුල් අකුර Capital හා අනෙක් සියලු අකුරු Simple වේ.
	සියලු අකුරු Capital අකුරින් තබයි.

viii. පැතුරුම්පත් මෘදුකාංගයක ඇති වැඩ පොත හා වැඩ පත අතර ඇති වෙනස පහත සඳහන් කරුණු අනුව සත්‍ය /අසත්‍ය දක්වන්න.

a) වැඩපොතක අවම වශයෙන් එක් වැඩ පතක් හෝ ඇති විශාල වැඩපත් සංඛ්‍යාවක් අඩංගු වේ.(.......)
b) වැඩපොතකට වැඩ පත් එකතු කිරීමට , මැකීමට හා ප්‍රති නාම කරණයට හැකිය. (.......)
c) කිසිම වැඩ පතක නමට බලපෑමක් නොමැතිව වැඩ පොතක් ද ප්‍රතිනාමකරණය කළ නොහැකිය (.......).
d) කවුළුව පතුලේ ඇති පත්‍රිකා ටැබ් මත ක්ලික් කිරීමෙන් වැඩ පොත තුල වැඩපත් අතර මාරු විය හැකිය. (........)

ix. මෘදුකාංග වර්ගීකරණයට අනුව පද්ධති මෘදුකාංග එක් ප්‍රධාන කොටසක් වන අතර ඒ සඳහා උදාහරණ 02 ක් සඳහන් කරන්න.

x. වගු එකතුවකින් සැදුම්ලත් දත්ත ගබඩාවක් දත්ත සමුදායක් ලෙස හැඳින්වෙන අතර එය කළමනාකරණය කර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා මුලික අංග 2ක් නම් කරන්න.

2) පහතින් දැක්වෙන්නේ පරිගණක සංරචක අඩංගු රූප සටහනකි.



i. මධ්‍ය සැකසුම් ඒකකයට අයත් ප්‍රධාන සංරචකයන් මගින් කෙරෙන කාර්යයන් වෙන වෙනම සඳහන් කරන්න.

ii. ආදාන ඒකකය මගින් ඉහත පරිගණක ක්‍රියාවලිය තුල සිදු කරනු ලබන කාර්යය සඳහන් කර ඒ සඳහා උදාහරණයක් දෙන්න.

iii. ප්‍රතිදාන ඒකකය මගින් ඉහත පරිගණක ක්‍රියාවලිය තුල සිදු කරනු ලබන කාර්යය සඳහන් කර ඒ සඳහා උදාහරණයක් දෙන්න.

3) ඔවුනොවුන්ගේ දර්ශනයන්, අදහස්, දැනුම විශාල කණ්ඩායමක් සමග හුවමාරු කර ගැනීමට සමර්පණ භාවිත කරයි.

i. හොඳ සමර්පනයක ලක්ෂණ 04ක් ලියන්න.

ii. බහු මාධ්‍ය අන්තර්ගතයන් සමර්පනයකින් ඉදිරිපත් කිරීමට යොදා ගන්නා විවෘත සමර්පණ මෘදුකාංගයකට හා වාණිජ සමර්පණ මෘදුකාංගයකට උදාහරණයන් 02ක් දෙන්න.

iii. සමර්පණ මෘදුකාංගයක මුලික කොටස කදා වේ. එහි ඇති පෙනුම (view) 4ක් ලියන්න

iv. කදා සංක්‍රමණය හා කදා සජීවනය අතර ඇති වෙනස කුමක්ද?

4) පහත දැක්වෙනුයේ හෙල්පින් ශ්‍රී ආයතනය මගින් කරනු ලැබූ මිලදී ගැනීමකට අදාල බිල්පතකි.

	A	B	C	D	E	F	G	H	I
1									
2		**lakshani enterprises**							
3		anuradhapura road				Phone:	074-0960738		
4		mihinthale				Fax:	025-2266277		
5		50300				E-mail:	lakshani.enter@gmail.com		
6									
7		*Statement*							
8									
9		Statement #:	lak00132			Bill To:	sera jhoe		
10		Date:	October 30, 2022				helping sri		
11		Customer ID:	lakcus0512				galle road		
12							bambalapitiya		
13									
14		ITEM NUMBER	ITEM	NUMBER OF UNITS	UNIT PRICE	AMOUNT	DISCOUNT	TOTAL	
15		1	PEN DRIVE(64GB)	9	3570	32130	3213	28917	
16		2	MOTHER BOARD	5	18700	93500	9350	84150	
17		3	KEYBOARD	4	1260	5040	504	4536	
18		4	MOUSE	6	960	5760	576	5184	
19		5	DVD (50) PACK	2	3200	6400	640	5760	
20		6	HP LAPTOP(CORE i3)	5	280000	1400000	140000	1260000	
21		7	MULTIMEDIA PROJECTOF	2	214000	428000	42800	385200	
22		8				0	0	0	
23		9				0	0	0	
24		10				0	0	0	
25				TOTAL BIL				1773747	
26				PAYMENT				1800000	
27				BALANCE				26253	
28									

1. AMOUNT ගණනය කිරීම සඳහා F15 කෝෂයට ඇතුලත් කලයුතු සූත්‍රය ලියන්න. (මෙම සූත්‍රය F15 සිට F24 දක්වා පිටපත් කල යුතුව ඇත)

2. DICOUNT ගණනය කිරීම සඳහා G15 කෝෂයට ඇතුලත් කලයුතු සූත්‍රය ලියන්න. (මෙම සූත්‍රය G15 සිට G24 දත්වා පිටපත් කල යුතුව ඇත)

3. TOTAL ගණනය කිරීම සඳහා H15 කෝෂයට ඇතුලත් කලයුතු සූත්‍රය ලියන්න. (මෙම සූත්‍රය H15 සිට H24 දත්වා පිටපත් කල යුතුව ඇත)

4. ඔබ ඉහත 1 ප්‍රශ්නයේ සූත්‍රය F15 සිට F24 දක්වා පිටපත් කරන ආකාරය ලියන්න.

5. මුළු බිලෙහි එකතුව ගණනය කිරීම සඳහා H25 කෝෂයට ඇතුලත් කලයුතු සූත්‍රය ලියන්න.

5) (අ) ගොනු කළමනාකරණය යනු පරිගණක පද්ධතියේ වූ ද්‍රඩාංග කළමනාකරණ ක්‍රියාවලියේ එක් ක්‍රියාවලියක් වේ.

i. ගොනු කළමනාකරණය සඳහා මෙහෙයුම් පද්ධතිය මගින් ඉටු කරනු ලබන සේවාවන් 03 ක් ලියන්න.

ii. අප විසින් සුරකිනු ලබන ගොනු වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට හැක්කේ කෙසේ ද ?

(ආ) පහත දැක්වෙන්නේ පොත් ප්‍රදර්ශණයක් සම්බන්ධයෙන් වදන් සැකසුම් මෘදුකාංගයකින් සකස්කරන ලද දැන්වීමකි. 1 රූපයෙන් හැඩසව් කිරීමට පෙර හා 2රූපයෙන් හැඩසව් කල පසු ඇති ආකාරය දක්වා ඇත. 3රූපය තුලින් දක්වා ඇත්තේ හැඩසව් කිරීමට යොදා ගත් මෙවලම් තීරුවයි.



1 රූපය



2රූපය



3 රූපය

1රූපයේ ඇති දැන්වීම 2රූපය මෙන් හැඩසව් කිරීමට යොදාගත් මෙවලම් මොනවාදැයි 3රූපයෙන් සොයා ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් අදාල මෙවලම් අංකය යොදන්න.

6) පහත පෙන්වා ඇති දත්ත සමුදාය වගු සලකන්න. එම වගු ඇසුරෙන් දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඇ. අංකය	කණ්ඩායම
14690	A
14598	A
14695	B
15108	B
14623	B

අත්පන්දු වගුව

ඇ. අංකය	කණ්ඩායම
15135	A
14598	B
15108	A
14690	B

ක්‍රිකට් වගුව

ඇ. අංකය	නම	උපන්දිනය
14690	කුමාරි	2003.05.02
15135	නිලීමා	2003.02.24
14598	ඉරෝෂා	2003.06.27
15108	ෆාතිමා	2003.02.27
14695	ප්‍රනීෂා	2003.12.13
14623	දිස්නා	2003.06.05

ශිෂ්‍ය වගුව

1. මෙහි ප්‍රාථමික යතුරක් නම් කරන්න.
2. ශිෂ්‍ය වගුව හා ක්‍රිකට් වගුව අතර ඇත්තේ කුමන ආකාරයේ සබඳතාවයක් (Relationship) ද?
3. 15135 සිසුවිය ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉවත් ව අත්පන්දු ක්‍රීඩාව කරයි නම් යාවත් කාලීන කළයුතු වගුව/වගු මොනවාද?
4. මෙම පාසලට නයනා නම් නවක ශිෂ්‍යාවක් ඇතුළත් වූ අතර ඇය ක්‍රිකට් ක්‍රීඩාව ඇරඹුවේ නම් යාවත්කාලීන කළ යුතු වගු මොනවාද?
5. දත්ත ගබඩා කිරීමේ දී මෙම වගු තුන වෙනුවට තනි වගුවක් භාවිතා කළේ නම් ඇති වන අවාසියක් ලියන්න

7) පහත සඳහන් මාතෘකා 03ක් පිලිබඳ කෙටි විස්තර ලියන්න

i. පරිගණකසං දත්ත ඉදිරිපත් කිරීමේ ක්‍රම

ii. පරිගණක තොටු / කෙවෙනි

iii. පරිගණනකයේ අතීත කතාව

iv. විවිධ ක්ෂේත්‍රයන්හි තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ භාවිතය

10 ශ්‍රේණිය - 2022 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය- අවසාන වාර පරීක්ෂණය

ICT GRADE 10 MARKING SCHEME FOR MCQ

Q NO:	ANSWER	Q NO:	ANSWER
1	**3**	21	**2**
2	**4**	22	**3**
3	**3**	23	**3**
4	**4**	24	**3**
5	**3**	25	**2**
6	**3**	26	**3**
7	**3**	27	**3**
8	**2**	28	**3**
9	**2**	29	**3**
10	**2**	30	**2**
11	**3**	31	**1**
12	**1**	32	**4**
13	**4**	33	**4**
14	**2**	34	**4**
15	**3**	35	**2**
16	**3**	36	**1**
17	**1**	37	**2**
18	**2**	38	**3**
19	**4**	39	**4**
20	**3**	40	**1**

2 කොටස

1.

i. 4 ,7

ii.

ස්විචය	නාභිය
• **හුවමාරු කරන තොරතුරු අදාල පරිගණකය වෙතට පමණක් යොමු කරයි.** • **පූර්ණ ද්විපථ විධික්‍රමය යොදා ගනියි.** • **හුවමාරු වේගය වැඩිය.**	• **හුවමාරු කරන තොරතුරු සියළුම පරිගණක වෙතට යොමු කරයි.** • **අර්ධ ද්විපථ විධික්‍රමය යොදා ගනියි.** • ***හුවමාරු වේගය අඩුය.**

iii. විශේෂ ස්ථානයක් අවශ්‍ය නොවීම.
ගමනාගමනය සඳහා ගතවන කාලය අවම වේ.

ශ්‍රමය සහ වියදම අවම වේ. යනාදිය

iv. $8EC_{16}$

8 E C

1000 1110 1100

100011101100_2

v. (P.J)+ (C+D) (බූලීය ප්‍රකාශනය ප්‍රමාණවත් වේ)

vi. පරිගණකයේ දත්ත තැන්පත් කිරීමට ගොනු භාවිත කරන අතර ඒවා විධිමත්ව කළමනාකරණය කිරීමට ගොනු බහාලුම් යොදා ගනු ලබයි..

vii. 1- tOGGLE cASE

2- Capitalize Each Word

3- Sentence case

4- UPPER CASE

viii.

a) ✓

b) ✓

c) ×

d) ✓

ix. මෙහෙයුම් පද්ධති, උපයෝගීතා මෘදුකාංග, භාෂා පරිවර්ථක හෝ මේ යටතේ එන ඕනෑම මෘදුකාංගයක්

x. වගු, වාර්තා, විමසුම්, ආකෘති

2.

i. ALU- සියලුම අංක ගණිතමය හා තාර්කික ක්‍රියා සිදු කරයි.

CU – පරිගණක පද්ධතියේ සියලුම උපක්‍රම පාලනය කරයි

Registers – ALU හි ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාවලී සඳහා අවශ්‍ය වූ දත්ත සහ එහි ප්‍රතිඵල තාවකාලිකව රඳවා තබා ගනී

ii. පරිගණක පද්ධති තුළට දත්ත හා උපදෙස් ඇතුලු කිරීමට ආදාන උපාංග යොදා ගනු ලබයි.

ඕනෑම ආදාන උපක්‍රම 02 ක් සඳහා ලකුණු ලබා දෙන්න

iii. සකස් කරනු ලබන දත්ත තෙරතුරු පිටතට ලබා දීමට ප්‍රතිදාන උපක්‍රම භාවිතා කරනු ලබයි

ඕනෑම ප්‍රතිදාන උපක්‍රම 02 ක් සඳහා ලකුණු ලබා දෙන්න

3.

i.

- අඩංගු විය යතු වාක්‍ය පේළි ප්‍රමාණය - එක් කදාවකට 6-9 අතර විය යුතුය.
- අකුරු වල විශාලත්වය font size 32 අතර ප්‍රමාණයකි.
- අක්ෂර වින්‍යාසය හා භාෂා යෙදුම් නිවැරදි වීය යුතුය.
- පින්තූර ,චිත්‍රක හෝ වගු ඇතුළත් කිරීම උපරිම 2ක් විය යුතුය... යනාදී වශයෙනි

ii.

මුදල් ගෙවා ලබා ගත හැකි මෘදුකාංග

Apple Keynote

Corel Presentation

Microsoft PowerPoint

නිදහස් හා විවෘත කේත මෘදුකාංග

Open Office . Org Impress

LibreOffice Impress

iii. කදා සංක්‍රමණය යනු එක් දෘෂ්‍ය රාමුවකින් තවත් දෘෂ්‍ය රාමුවකට මාරු වීමේ දී වේගය, ශබ්දය, ස්වයංක්‍රීයව කදා මාරු වීම යනාදී සම්බන්ධයෙන් සිදු කරනු ලබන විවිධාකාර සැකසීම් වන අතර කදි සජීවීකරණය යනු කදා තුළ අඩංගු විවිධකාර පාඨ, චිත්‍රක, ආදිය සඳහා චලන අඩංගු කිරීමයි.

4.

i. =D15*E15

ii. =F15*0.1 , = F15*10%

iii. =F15 - G15

iv. F15 කෝෂය තෝරන්න
ඒ මත copy විධානය ලබා දෙන්න
F16 : F24 කෝෂ පරාසය තෝරන්න
ඒ මත Paste විධානය ලබා දෙන්න
හෝ
F15 කෝෂය තෝරා එහි ස්වයං පිරවුම් හැඩලය මගින් F24 දක්වා Drag කරන්න.

5.

i. - නව ගොනු සකස් කිරීම
- අනවශ්‍ය ගොනු මකා දැමීම.
- ගොනු හා ෆෝල්ඩර් වල නම වෙනස් කිරීම.
- ගොනු හා ෆෝල්ඩර් පිහිටි ස්ථාන වෙනස් කිරීම.

ii. ගොනු නාමය හා එහි දිගුව මගිනි

iii.

A-14	E- 16	I- 1
B- 8	F- 9	J-6
C-4	G-2	
D-10	H- 3	

6.

i. ශිෂ්‍ය වගුව ⟶ ඇතුළත්වීමේ අංකය

ii. එක එක සම්බන්ධතාවයකි.

iii. ක්‍රිකට් වගුව හා අත්පන්දු වගුව

iv. ශිෂ්‍ය වගුව හා අත්පන්දු වගුව

v. දත්ත විශ්ලේෂණයට අපහසු වීම
යාවත්කාලීන කිරීමේ අපහසුතා ඇති වීම යනාදී වශයෙන්

7. තෝරාගත් මාතෘකාව සඳහා නිවැරදි කරුණු 03ක්වත් යොදා ගනිමින් කෙටි විස්තරයක් අඩංගු වේ නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න